රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 163.

මගේ අංකය: 1/53/වි/4
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.
1980 මාර්තු මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## යතුරු ලේඛක සංසද පිහිටුවීම

මෙම අමාත්‍යාංශයෙන් නිකුත් කෙරුණු අංක: 1/53/අමාත්‍යාංශ/විවිධ/4 සහ 78.08.03 වන දිනය දරණ චක්‍රලේඛය බලනු මැනවි.

මධ්‍ය යතුරු ලේඛක සංසදයන් පිහිටුවා සිය යතුරු ලිවීමේ වැඩ කටයුතු සංවිධානය කිරීමට ඇතැම් දෙපාර්තමේන්තු තවම අපොහොසත් වී ඇති බව පෙනේ.

ඇතැම් යතුරු ලේඛකයන්ට පමණට වඩා වැඩ පැවරී ඇති අතර සෙස්සන්ට පැවරෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. යතුරු ලේඛක සේවය මධ්‍යගත කිරීමෙන් මේ තත්ත්වය මග හරවා ලිය හැක. තවද අතිකාල වැඩද එමගින් අඩු වීමට ඉඩ තිබේ.

මේ අන්දමේ සංසදයක ප්‍රධානයා වශයෙන් ජ්‍යෙෂ්ඨ යතුරු ලේඛකයකු පත් කළ හැකිය. ඒ ඒ යතුරු ලේඛකයාට දිනපතා බාර දෙන වැඩ පිළිබඳ ලේඛණයක් තබා ගැනීම ඔහුට කළ හැකි ය. සංසදයේ වැඩ කටයුතු පාලනය කිරීමට මෙම ලේඛණය ප්‍රයෝජනවත් වේ. තවද වැඩ සමායෝජනය කිරීමට හා සෙසු යතුරු ලේඛකයන්ට මග පෙන්වීමටත්, ද්‍රව්‍ය භාවිතය අතින් අරපිරිමැස්මක් ඇති කිරීම, වැඩ කටයුතු වඩාත් හොඳින් සැලසුම් කිරීම හා කරනු ලබන වැඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම යන මේ පරමාර්ථයන් ඉෂ්ට කර ගැනීමටත් සංසදයේ ප්‍රධානියාට හැකිවනු ඇත.

අ.භා./ ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

එස්.එස්.ඒ. ජයසිංහ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ.